සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
*All Rights Reserved]*

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / **இலங்கைப் பரீட்சைத் திணைக்களம்** / Department of Examinations, Sri Lanka

# ලංකා බැංකුව සඳහා අභ්‍යාසලාභී නොතාරිස් ලිපිකරුවන් තෝරාගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණය සහ වේග පරීක්ෂණය - 2016

## (01) ලිඛිත පරීක්ෂණය

පැ දෙකයි

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

---

**1.** (i) නොතාරිස් ආඥා පනත යටතේ යම් තැනැත්තෙකු නොතාරිස් ධූරයට පත්කිරීමේ ක්‍රමය සඳහන් කරන්න.

(ii) නොතාරිස් ආඥා පනත යටතේ නීතිඥවරයකු නොවන අයකුට නොතාරිස්වරයකු වීම සඳහා අවශ්‍ය සුදුසුකම් කවරේ ද?

(iii) නොතාරිස් ආඥා පනත යටතේ වලංගු බලපත්‍රයක් නොමැතිව නොතාරිස්වරයකු ලෙස වෘත්තියෙහි යෙදෙන අයකුට විරුද්ධව පැනවිය හැකි දණ්ඩන කවරේ ද?

(iv) නොතාරිස්වරයකු වීමට ප්‍රථමයෙන් අවශ්‍යතාවක් ලෙස නොතාරිස් ආඥා පනත යටතේ සැපයිය යුතු ඇප වර්ග කවරේ ද?

(v) 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ලියාපදිංචි කළ කුමන ඉඩම් කොටස් සඳහා බෙදුම් පනත අදාළ නොවන්නේ ද?

(vi) 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනත යටතේ සඳහන් පිඹුරු වර්ග තුන කවරේ ද?

(vii) 'පූර්ව ලියාපදිංචිය' යනු කවරේ ද?

(viii) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ නිශ්චල දේපළක ලියාපදිංචිය අවශ්‍ය වන්නේ කුමන හේතුවක් නිසා ද?

(ix) 'ඇටෝර්නි බලපත්‍රය' යනු කවරේ ද?

(x) සමාගම් පනත යටතේ 'ඍණ පත්‍රයක්' යන්නෙන් අදහස් කරන්නේ කවරක් ද?

*(ලකුණු 02 × 10 = 20 යි)*

**2.** (i) 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ඉඩම් කොටසක ලියාපදිංචිය කුමන ලියවිල්ලට අදාළව සිදු කරන්නේ ද?

(ii) 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ :-

(අ) තමාට පවරන ලද කාර්ය හා කර්තව්‍ය සිදු කිරීමට වගකිවයුතු නිලධරයන් කවරහු ද?

(ආ) හිමිකම් රෙජිස්ටර පවත්වාගෙන යාමට වගකිවයුතු නිලධරයන් කවරහු ද?

(iii) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ 'සන්තකය ලියාපදිංචි කිරීම' පිළිබඳ කෙටි සටහනක් ලියන්න.

*(ලකුණු 20 යි)*

**3.** (i) පැවරීමේ ඔප්පුවක් විධිමත් ලෙස ලියා අත්සන් කිරීමට පෙර යම් නිශ්චල දේපළක වටිනාකම ලබාගත යුතු වන්නේ කවර හේතු නිසා ද?

(ii) 'හරස් සටහනක් (Cross Reference)' යනු කවරේ ද?

(iii) නොතාරිස්වරයකු විධිමත් ලෙස ලියා අත්සන් කරන ලද පැවරුම් ඔප්පුවක් මත මුද්දර ගාස්තු ගෙවීමේ ක්‍රියාවලිය සහ එම ඉඩම සම්බන්ධයෙන් බැංකුවක් මාර්ගයෙන් විධිමත් ලෙස ලියා අත්සන් කරන ලද උකස්කරයක් මත මුද්දර ගාස්තු ගෙවිය යුතු ආකාරය සඳහන් කරන්න.

*(ලකුණු 20 යි)*

[ 2 වැනි පිටුව බලන්න.

**4.** (i) 'දේපළක මාර්ග අයිතිය' යනු කවරේ ද?

(ii) ඉඩමක් මිලදී ගන්නා අයකු විසින් හඳුනාගත යුතු, ඉඩම් සම්බන්ධයෙන් පැවතිය හැකි අවහිර හෝ බාධා කවරේ ද?

(iii) උකස් හිමියකු විසින් බැංකුවකට සපයන හිමිකම් වාර්තාවක සඳහන් විය යුතු අත්‍යවශ්‍ය කරුණු කවරේ ද?

*(ලකුණු 20 යි)*

**5.** (i) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ ලියාපදිංචි කිරීමේ ක්‍රමය කවරේ ද?

(ii) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ ලිස්පෙන්ඩනයක් (Lispenden) අවලංගු කිරීම සඳහා ඉල්ලුම් කිරීමට හැකියාව ඇති පුද්ගලයන් දෙදෙනෙකු සඳහන් කරන්න.

(iii) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ සඳහන් පරිදි 'කේවියට් (Caveat) තහනම' පිළිබඳ කෙටි සටහනක් ලියන්න.

*(ලකුණු 20 යි)*

***

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
*All Rights Reserved]*

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

## ලංකා බැංකුව සඳහා අභ්‍යාසලාභී නොතාරිස් ලිපිකරුවන් තෝරාගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණය සහ වේග පරීක්ෂණය - 2016

විනාඩි දහයයි

### (02) වේග පරීක්ෂණය

වේගය : විනාඩියකට වචන 25

**විභාග අපේක්ෂකයින්ට උපදෙස්**

- ✼ ප්‍රශ්න පත්‍රයේ මුල පිටුවේ ඇති I කොටස නිවැරදිව පරිගණකයෙන් ටයිප් කිරීම මෙම පරීක්ෂණය සඳහා ප්‍රමාණවත් ය.
- ✼ කාලය ඉතිරිව තිබේ නම් පමණක් දෙවන පිටුවේ දැක්වෙන II කොටස මුල සිට ටයිප් කරන්න. තවදුරටත් කාලය ඉතිරිව තිබේ නම් දෙවන පිටුවේ ඇති II කොටසම නැවත වරක් මුල සිට ටයිප් කරන්න. ලකුණු ලබාදීමේ දී ඒ පිළිබඳව සලකා බලනු ලැබේ.
- ✼ පළමු පිටුවේ දැක්වෙන I කොටස නැවත වරක් ටයිප් කිරීම වෙනුවෙන් ලකුණු නොලැබේ.

### I කොටස

බැංකු ක්ෂේත්‍රය, විශේෂයෙන් රාජ්‍ය බැංකු දෙක වන ලංකා බැංකුව සහ මහජන බැංකුව රජයේ බැංකු බවත්, එම නිසා ඒවායේ ඇති මුදල් ද රජයේ මුදල් බවත්, රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුව ගැමියාගේ ආර්ථික කටයුතු සකස් කර ගැනීම සඳහා මූල්‍ය පහසුකම් ලබා දීමට බැංකු ක්‍රමය බැඳී සිටින බවත්, ඒවා තමාට සහනාධාර වශයෙන් ලැබෙන මුදල් බවත් ගැමියාගේ හැඟීමයි. බැංකුවලින් ලැබෙන ණය මුදල් ඵලදායී අංශවල ආයෝජනය කළ යුතු බව හෝ ඒවා ආපසු ගෙවීමේ වගකීමක් තමන් සතු බව හෝ ගැමියා නොපිළිගනී. තමා ආයතනික අංශවලින් මෙතෙක් ලබා ගත් ණය මුදල් කවදා හෝ ඉදිරි දිනෙක, විශේෂයෙන් ම මැතිවරණ ආසන්න කාලයක අහෝසි කර හරිනු ඇත යන දැඩි බලාපොරොත්තුවක් ගැමි සිත් තුළ ජනිත වී ඇත. එබැවින් ආයතනික අංශයෙන් ලබා ගත් ණය මුදල් නොසලකා හැරීමේ ප්‍රවණතාවක් ගැමි සමාජය තුළ පවතී. මෙසේ කෙටි කාලීන වාසි සඳහා දිගු කාලීනව බැංකු ක්‍රමයෙන් ලබා ගත හැකි පහසුකම් සියල්ලම කැප කොට තිබීම කනගාටුවට කරුණකි.

ඉහත කී තත්ත්වයෙන් ඔවුන් මුදවා ගැනීම සඳහා විශාල කාර්යභාරයක් ඉටු කිරීමට සිදු වී තිබේ. කෙටි කාලීනව හා ඉක්මනින් ණය පහසුකම් ලබා දීමට ආයතනික නොවන අංශයට හැකියාවක් ඇතත්, ග්‍රාමීය අංශවල සංවර්ධනයකට අනිවාර්යයෙන්ම අවශ්‍ය වන දිගු හා මධ්‍ය කාලීන මූල්‍ය පහසුකම් ලබා දීමෙහිලා ඔවුන්ට හැකියාවක් නොමැති බව ග්‍රාමීය ජනතාවට අවබෝධ කළ යුතු ය. ආයතනික අංශයෙන් ණය ලබා ගැනීමේ හා ආයතනික නොවන අංශයෙන් ණය ලබා ගැනීමේ ඇති වාසි අවාසි ගැන අවබෝධයක් හා අධ්‍යාපනයක් ලබා දීමෙන් ගැමි ජනතාව පුනරුත්ථාපනය කිරීමට බැංකු ක්‍රමය මූලිකත්වය ගෙන කටයුතු කළ යුතු ය.

(කාලය ඉතිරිව තිබේ නම් දෙවන පිටුවේ ඇති II කොටස මුල සිට ටයිප් කරන්න.)

[ 2 වැනි පිටුව බලන්න.

**II කොටස**

ශ්‍රී ලංකාවේ සංවර්ධන බැංකු වශයෙන් ඇති පැරණි හා වැදගත්ම ආයතනය නම් 1955 දී පිහිටුවා ඇති ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාවයි. ඒ හැර 1979 දී ජාතික සංවර්ධන බැංකුව පිහිටුවා ඇත. එහෙත් මේවා තවම ග්‍රාමීය අංශය පිළිබඳ ප්‍රමාණවත් පරිදි අවධානය යොමු කර නොමැති බැවින් ග්‍රාමීය ණය කටයුතු කිරීමට තරම් දියුණු සංවර්ධන බැංකු ක්‍රමයක් ලංකාවේ නොමැති බව කිව හැකියි. එම නිසා රජය මේ සඳහා වාණිජ බැංකු යොදා ගැනීමට කටයුතු කර ඇත. ග්‍රාමීය අංශයට සම්බන්ධ ධීවර, කෘෂිකර්ම හා කර්මාන්ත ආදී විවිධ අමාත්‍යාංශ බැංකු සමග සංකච්ඡා කර නොයෙක් විධියේ ග්‍රාමීය සංවර්ධන ණය යෝජනා ක්‍රම බැංකුවලට හඳුන්වා දෙමින්, ඒ සඳහා එම ආයතනවල ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සහයෝගය ද බැංකුවලට ලබා දීම පෙනෙන්නට ඇත.

රජයේ බැංකුව වශයෙන් මහ බැංකුව ඉදිරිපත් වී අඩු පොලියක් අය කිරීමට අවශ්‍ය ප්‍රතිමූල්‍ය සහ ණය අවදානම අඩු කිරීමට අවශ්‍ය ඇප ආවරණ සහ උපදෙස් වාණිජ බැංකු වෙත ලබා දී ඇත. මේ අනුව ග්‍රාමීය ණය යෝජනා ක්‍රම සහ අවශ්‍ය චක්‍රලේඛ උපදෙස් රජයත් මහ බැංකුවත් වාණිජ බැංකුවලට ඉදිරිපත් කර ඇත. මෙහි ඇති විශේෂ ලක්ෂණය නම් මෙම ණය ක්‍රම සඳහා නිතරම රාජ්‍ය බැංකු දෙක පමණක් සහභාගි වීමයි. පෞද්ගලික හා විදේශීය බැංකු මෙම ග්‍රාමීය ණය ක්‍රම සඳහා සහභාගි වී නොමැත. මෙයින් පැහැදිලි වන්නේ රාජ්‍ය බැංකු දෙකම මෙවැනි ණය ක්‍රම පිළිගත යුතු යයි බැඳීමක් ඇති බවයි. රාජ්‍ය බැංකු දෙක විසින් මෙම ණය ක්‍රම ක්‍රියාත්මක කර ඇති අයුරින් ඒ බව පැහැදිලි වේ. එනම් චක්‍රලේඛ ප්‍රයෝජනයට ගෙන මුළු රට තුළම එක් වර ක්‍රියාත්මක වන අයුරින් ණය ලබා දීමයි.

(තවදුරටත් කාලය ඉතිරිව තිබේ නම් මෙම පිටුවේ ඇති II කොටස නැවත වරක් මුල සිට ටයිප් කරන්න.)

* * *